# “සැඟව ගියත් නෙතු කඳුලක් දී රහසින් ස්වර්ගයේදී යලි හමුවෙමු අපි සෙනෙහෙන්...”



**දෙව්නක අභිසිත් නදීප ධර්මසිරි**

එදා සැප්තැම්බර් මස සෙනසුරාදා දිනකි. ඒ දිනය පිළිබඳ නිශ්චිත මතකයක් නොවුවත්, එදින් සිදුවූ සියලුම සිදුවීම්, දැනුණු හැඟීම් චිත්‍රපටයක් සේ අදටත් මා හද තුළ සිතුවම්ව ඇත. මාගේ දෛනික කාල සටහන අනුව සෙනසුරාදා දින කාර්යබහුල දිනයක් වුවද, මාගේ සංගීත ගුරුතුමිය ප්‍රියන්ති සෙනවිරත්න වැන්ඩෝට් මහත්මිය පවත්වන ගායනා පංතිය කිසිදින මඟහැරීමට මට නොසිතුණි. එදින පිළිබඳ ශේෂව ඇති මගේ මතකයට අනුව එදා ගායනා පංතියට යෑමට පෙර මට තවත් පංතියකට යෑමට සිදුවූ හෙයින් මා තරමක් එදා පංතියට යෑමට ප්‍රමාද වුණෙමි. එහි දොරටුවෙන් ඇතුල් වුණු මට මධුර කටහඬක් ඇසිණ. එම කටහඬ තුළින් ගැයුණේ මගේ එක් ප්‍රියතම ගීතිකාවක් වූ “ජේසු අම්මේ මේ අහන්න” යන ගීතිකාවයි. ඒ හඬ පිළිබඳව ඇතිවුණු කුතුහලය නිසාම මා තරමක් කලබල විය. එහි ඇතුල්වුණු මා හට පෙනුණේ අලුත් සාමාජිකයෙක් පැමිණි බවටයි. හුරතල් මුහුණක්, උණුසුම් සිනහවත් මට ඔහුගේ චරිතය පිළිබඳව පැහැදිලි කරවීය. ඒ නෙත් තුළින් නික්මුණු දීප්තිය මා පුදුම කරවීය. මගේ සංගීත ගුරුතුමිය පැවසුවේ “රවිඳු, මෙන්න ඔයාගේ අළුත් යාළුවා, නදීප” යනුවෙනි. එය මේ සියල්ලේ ආරම්භයයි.

දෙව්නක අභිසිත් නදීප ධර්මසිරි ජන්මය ලැබුවේ රැක්ලාන්ති මහත්මියට සහ අජන්ත ධර්මසිරි මහත්මයාට දව උපන් දෙවන දරුවා ලෙසය. ඔවුන්ට උපන් වැඩිමල් දියණිය, නවෝදි විය. නදීපගේ ජන්ම දිනය 28.09.2002 දිනය විය. ඔහු ඉතාම නිහතමානී, අවංක, නිතරම සිනහ මුහුණින් සැවොම පිනවූ අයෙකි. ඔහු තුළ සංගීතය හා තාක්ෂණවේදය

උදෙසා වූ ඇල්ම අතිමහත්ය. තම පාසල වූ රාජකීය විදුහලේ කනිෂ්ඨ ශිෂ්‍ය නායකයෙකුවද, ගීතිකා කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙසද තම විදුහලට විශාල සේවයක් ඉටු කලේය. අප දෙදෙනා තුළ වූ සමානකම් අතර අප අනාගත බලාපොරොත්තුව ද විය. ඒ පූජාත්වරය පිණිස ලැබූ කැදවීමයි. ඔහු තුළ ඊට අමතරව විද්‍යාඥයෙකු වීමටද කැමැත්ත විය.

අප දෙදෙනා තුළ වූ සබඳතාව මිතුරුකම ඔබ්බට ගිය සහෝදරකමකි. අප දෙදෙනා හමුවූයේ සතියකට එක් වාතාවක් පමණක් වුවත්, අප දෙදෙනා සුහඳ කතාබහක නිරතවීමට අමතක නොකළෙමු.

2015 ජනවාරි මස 13 දින අප දෙදෙනාට ඉතාම විශේෂ දිනයක් විය. ඒ අප දෙදෙනාගේ භාග්‍යකට මෙන් සුදතුම් පියතුමා අප රටට පැමිණි අවස්ථාවේ එතුමා පිළිගැනීමට නිර්මාණය කළ විශේෂ ගීතිකා කණ්ඩායමේ සාමාජිකයන් වීමය. ඔහු කොතරම් වරක් ප්‍රසිද්ධියේ ගායනා කළේද, කථා පැවැත්වුවද, ඒ සෑම අවස්ථාවකටම වඩා ශුද්ධෝත්තම පියතුමා ඉදිරියේ ගායනා කිරීමට ලැබීම ඔහු පැවසුවේ මහත් ආඩම්බරයකිනි. එදින උදෑසන ඉතාමත් විශේෂ සිදුවීමක් විය. අප මුළු ගීතිකා කණ්ඩායමම ම උදෑසන ආහාරය පිණිස එක්තරා ප්‍රසිද්ධ හෝටලයකට ගියෙමු. එහිදී එක් කුඩා දරුවෙකු (අප සමගම සිටිය) හෝටල් පිරිශ්‍රයේ සාමකාමී පරිසරය කඩන අයුරින් උදෑසන 4.00 ට පමණ කෑගසමින් ඒ අත, මේ අත දිව ගියේය. අප දෙදෙනා හට බාරදුන් ළමුන් නිසියාකාරව බලානොගැනීම නිසා ප්‍රියන්ති ගුරුතුමිය අප සියලුදෙනා හෝටල් කොරිඩෝවේ දිගටම සිටගෙන සිටීමට දඩුවම් කලේය. අතිශයින්ම බිය වූ ම අසල සිටි නදීපගේ මුළු සිරුරම ඩහඩියෙන් තෙත් විය. ඔහු බියවුණේ තම ඥාතීන්ගේ බලාපොරොත්තු ඉටුකිරීමට නොහැකි වේවි යන සැකය නිසාවෙනි. එයින් ප්‍රකාශ වන්නේ ඔහු කෙරෙහි ඥාතීන්ට තිබූ ප්‍රේමයයි.

සෑම ජීවිත කතාවකම මෙන් මා මිතුරු නදීප හටත් ජීවිතය කර්කශ වූ අවස්ථා එමටය. එක් අවස්ථාවක ඔහු පිහිනුම් තටාකයේ වැටී, දෙමසක් යනතුරුම ආධාරක භාවිතා කිරීමෙන් ඇවිදීමට සිදුවිය. කුමන අභියෝගයක වුවද ඔහු නොසැලී සිටියේ ඔහු තුළ වූ ශක්තිමත් ඇතුළාන්තය නිසාවෙනි. ඔහුගේ එම නොසැලෙන දිරිය මා පවා විස්මිත කරවීය.

ඔහු රෝහල්ගත කල ආරංචිය ඇත්තෙන්ම මට ශෝකය දනවන්නක් විය. ඔහුගේ සැපදුක් බැලීමට මා ගිය නමුත් ඔහු හා කතාකිරීමට මට නොහැකි විය. ඒ ඔහු බැලීමට මට අවසර තිබුණේ ජනේලයක් මගින් පමණකි. එහි වූ නදීප දුටු මට මා දෑස් අදහාගත නොහැකි විය. එයට හේතුව වූණේ ඊට සතියකට පෙර තිඹිරිගස්යාය සාන්ත තෙරේසා දේවස්ථානයේ වූ විවාහ මංගල පූජාවකට අප ගීතිකා කණ්ඩායම ගායනා කළ හෙයිනි. අභාග්‍යකට මෙන් මා සදාදරණීය මිතුරා මෙලොව අතහැර 08.08.2016 දින ස්වර්ගීය සැපත උරුමකරගත් නිසා ඔහුට ලෙන්ගතුව කටයුතු කළ සියලු දෙනාගේ දෙනෙත් කඳුලින් තෙත් විය. ඔහුගේ වියෝව පිළිබඳ පුවත සවන් වැකුණු සියලු දෙනාගේ මුහුණු තුළින්, ඔහු කෙරෙහි වූ දුක හා ආදරය මැනවින් දිස්විය.

මා ඔහුගෙන් ඉගෙන ගත් ආදාර්ශයන්ද බොහෝය. ඒවායින් කුඩා ප්‍රමාණයක් නම්; ස්වයං හික්මීම, විශ්වාසීව අන් සැම දෙනා හට ළං වීම, නොසැලෙන දිරිය, නිහතමානීකම, පරාර්ථකාමී බව, සැමට එක සේ උදව් කිරීම හා ප්‍රේමය දැක්වීම ඒ ගුණාංගවලින් කිහිපයකි. ඔහු පිළිබඳ ලිවීමට දේ කොතරම් ඇතත්, මා මෙතනින් නිමා කරමි.

නදීප, මා ආදර මිතුර, වසරකට පෙර ඔබ මා හැර ගියත් මා ඔබගේ සදාදරණීය හා විශාලතම රසිකයා වෙමි. එය සදාකාලයටම එසේ වේවි. ඔබට නිත්‍ය සැපත ලැබේවා!

මීට ඔබ ආදර සබඳ,
**රවිඳු ෆොන්සේකා**